
# 15. නිසසල යැදුම්

හැම පැත්තෙන් ම සීතල සුළං හමනවා. ටිකෙන් ටික අඳුර පැතිරෙනවා. එදා දවසේ වැඩ කටයුතු ඉවරයි.

ජේසුස් වහන්සේගේ ගෝලයෝ ඔරුවේ නැගලා එගොඩට ඔරුව පැද ගෙන ගියා. උන්වහන්සේගේ කතා අහන්න ආ මිනිස්සුත් රෑ බෝ වෙන්න ඉස්සෙල්ලා ගෙවල්වලට ගියා. නමුත් ජේසුස් වහන්සේ තනිව ම ඒ ළඟ තිබූ කඳු මුදුනට නැග්ගා. උන්වහන්සේ කන්ද මුදුනේ කුඩා ගල්වැටියක් උඩින් ඉඳගත්තා. දෑස් පියාගත්තා. පරිසරය හරි ම නිසලයි. ඒ වගේ ම අමුතු ම ලස්සනක්. ඉර බැහැගෙන යන මේ සවස් වේලේ ජේසුස් වහන්සේ දේව පියා සමග කතා කරන්න පටන් ගත්තා. මුළු දවස පුරා ලැබුණු ආසිරිවලට උන්වහන්සේ තුති කරන්න ඇති. තවත් අලුත් දවසක වැඩ කටයුතු කරන්නට දේව පියාගෙන් ශක්තිය, පිහිට, ඉල්ලන්න ඇත. හරියට පුංචි පුතෙක් තාත්තත් එක්ක දවසේ සිදු වුණ දේවල් කියන්නා වාගේ තමයි. ජේසුස් වහන්සේ දේව පියාත් එක්ක කතා කළේ.

පුංචි අපිටත් ජේසුස් වහන්සේ ඒ සිද්ධියෙන් ලස්සන පාඩමක් කියලා දුන්නා. දැක්ක ද? වැඩි ශබ්දයක්, කලබලයක් නැති නිශ්චල තැනකට වෙලා තාත්තට කතා කරන පුංචි දරුවන් වගේ, අපිත් අපේ දේව පියාට කතා කරන කොට කොයි තරම් ලස්සන ද?



## පැවරුම්

පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

1. ජේසුස් වහන්සේ දේව පියා සමග කතා කළේ කුමන අවස්ථාවල ද?
2. ඔබ සිතන පරිදි කඳු මුදුනේ දී යාච්ඤා කරමින් ජේසු තුමා දේව පියාගෙන් ඉල්ලන්නට ඇත්තේ මොනවා ද?